සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ගිණුම්කරණය - I

12 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

<u>උපදෙස්:-</u>

- ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා නිවැරදි පිළිතුරේ අංකය තෝරා තිත් ඉරි මත ලියන්න.
- අං 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.

---

(01) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව අනුව මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ගති ලක්ෂණ දෙක වන්නේ,

(1) අදාල බව, කාලීන බව
(2) විශ්වසනීය නියෝජනය, සංසන්දනාත්මක බව
(3) අදාල බව, විශ්වසනීය නියෝජනය
(4) අදාල බව, අවබෝධකරගත හැකිබව
(5) අදාල බව, සත්‍යාපනය කළ හැකිබව (......)

(02) වෘත්තීය ගිණුම්කරණ ආයතනයක් නොවන්නේ,

(1) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL)
(2) සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (ICMASL)
(3) ගිණුම්කරණ ශිල්පීය ආයතනය (AAT)
(4) වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CIMA)
(5) ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය (JMC) (......)

(03) ගිණුම්කරණ නිමවුම ට අයත් නොවන්නේ,

(1) ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
(2) මූල්‍යත්වය ප්‍රකාශය
(3) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
(4) බැංකු සැසඳුම් ප්‍රකාශය
(5) මුදල් ප්‍රවාහ ප්‍රකාශය (......)

(04) වගකීම් වැඩිවේ, වගකීම් අඩුවේ ''L + L -'' වර්ගයේ ගණුදෙනුවක් වන්නේ,

(1) ණයට භාණ්ඩ ගත්තා රු. 50,000.
(2) අයිතිකරු ප්‍රාග්ධනය යෙදුවා රු. 150,000.
(3) ණයහිමියන්ට ආපසු යැවුම් රු. 12,000.
(4) සම්පත් බැංකු ජංගම ගිණුමේ අවාසිදායක බැංකු ශේෂයක් තිබියදී ණයහිමියන්ට චෙක්පතක් නිකුත් කළා රු. 30,000.
(5) ලංකා බැංකු ජංගම ගිණුමේ වාසිදායක බැංකු ශේෂයක් තිබියදී ණයහිමියන්ට චෙක්පතක් නිකුත් කලා රු. 25,000.

(......)

(05) බණ්ඩාර දිසානායක මහතා රු. 300,000 ක ඩුප්ලෝ යන්ත්‍රයක් ණයට මිලදී ගත් අතර, ඔහු මුද්‍රණ ආයතනයක් පවත්වාගෙන යයි. ඒ සඳහා අවශ්‍ය තීන්ත තොගයක් රු. 50,000 කට අත්පිට මුදලට මිලදී ගත්තේය. ඉහත ගණුදෙනු හා සම්බන්ධ උපයෝගී පොත හා මූලික සාක්ෂිය පිළිවෙලින්,

(1) පොදු ජ'නලය, ගෙවීම් වවුචරය, ලැබීම් ජ'නලය, හරපත.

(2) පොදු ජ'නලය, ජ'නල් වවුචරය, ලැබීම් ජ'නලය, ලදුපත

(3) පොදු ජ'නලය, ජ'නල් වවුචරය, ගෙවීම් ජ'නලය, ගෙවීම් වවුචරය

(4) පොදු ජ'නලය, ජ'නල් වවුචරය, පොදු ජ'නලය, ජ'නල් වවුචරය

(5) පොදු ජ'නලය, ලදුපත, මුදල් පොත, බැරපත. (......)

(06) ව්‍යාපාරයක ශේෂ පිරික්සුම මඟින් ලබාගත් ගිණුම් ශේෂ කිහිපයක් පහත වේ.

A. අඩමාණ ණය වෙන් කිරීම 10 000

B. බොල් ණය 5 000

C. රඳවාගත් ලාභය 15 000

D. ක්ෂය වෙන් කිරීම 4 000

ඉහත ගිණුම් ශේෂ වලට අදාළ නිවැරදි වර්ගීකරණය,

	වත්කම්	වගකීම්	හිමිකම්
(1)	AB	D	C
(2)	ADB	C	
(3)	AD		BC
(4)	ABD		C
(5)	B		ACD

(......)

The National e-learning Portal for The General Education

(07) මුදල් පොතේ ලැබීම් පැත්තේ වට්ටම් තීරුවේ එකතුව පිටපත් කළ යුත්තේ,

(1) ලද වට්ටම් ගිණුමේ බැරට
(2) ලද වට්ටම් ගිණුමේ හරට
(3) දුන් වට්ටම් ගිණුමේ හරට
(4) දුන් වට්ටම් ගිණුමේ බැරට
(5) ඉහත කිසිවක් නොවේ (......)

(08) මූලික සටහන් පොතක් සහ ලෙජර් ගිණුමක් වශයෙන් පාවිච්චි කරන්නේ මෙයින් කුමන ගිණුම් පොතද?

(1) ජ'නලය
(2) දෛනික විකුණුම් පොත
(3) දෛනික ගැණුම් පොත
(4) මුදල් පොත
(5) ඉහත කිසිවක් නොවේ (......)

(09) පහත වැරදිවලින් ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන වරද කුමක් ද?

(1) රු. 15 000 ක අත්පිට විකුණුම් පොත්වලින් මඟහැරී ඇත.

(2) රු. 4 000 ලද වට්ටම් දුන් වට්ටම් ගිණුමට බැර කර ඇත.

(3) රු. 25 000 ක යන්ත්‍ර අලුත් වැඩියා වියදම යන්ත්‍ර ගිණුමට හර කර ඇත.

(4) රු. 5 000 ක ආපසු එවුම් ආපසු යැවුම් ගිණුමේ බැරට සටහන් කර ඇත.

(5) රු. 13 000 ක විකුණුම් ඉන්වොයිසියක් රු. 31 000 ක් ලෙස විකුණුම් ජ'නලයේ සටහන් කර ඇත.

(......)

(10) ආයතනයක් විසින් රු. 100 000 ක ණය පියවීම වෙනුවෙන් රු. 80 000 ක චෙක්පතක් ණයහිමියෙකුට නිකුත් කරන ලදී. නමුත් දින කිහිපයකට පසුව එම චෙක්පත අගරු වී ඇති බව ණයහිමියා විසින් දැනුම් දෙන ලදී. මෙම අගරු වීම සටහන් කිරීමේ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1)	බැංකු	හර	800 000	
	ණයහිමියෝ	බැර		80 000
(2)	බැංකු	හර	80 000	
	ලද වට්ටම්	හර	20 000	
	ණයහිමියෝ	බැර		100 000
(3)	අගරු චෙක්පත්	හර	80 000	
	ණයහිමියෝ	බැර		80 000
(4)	බැංකු	හර	100 000	
	ණයහිමියෝ	බැර		100 000
(5)	අගරු චෙක්පත්	හර	100 000	
	ණයහිමියෝ	බැර		100 000

(......)

(11) පහත ප්‍රකාශන අතුරින් නිවැරදි නොවන ප්‍රකාශනය තෝරන්න.

(1) මුදල් ගලා ඒමක් මගින් ආදායමක් ජනිත විය හැකි ය.
(2) වගකීම් පහළ යාමක් මගින් ආදායමක් ජනිත විය හැකි ය.
(3) වත්කම් ඉහළ යාමක් මගින් ආදායමක් ජනිත විය හැකි ය.
(4) මුල් ගලා යාමක් මගින් වියදමක් ඇතිවිය හැකි ය.
(5) වත්කමක් ඉහළයාමක් මගින් වියදමක් ඇතිවිය හැකි ය. (......)

The National e-learning Portal for The General Education

(12) වගකීමක ලක්ෂණයක් නොවන්නේ,

A. අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස හටගෙන තිබීම.
B. බැඳීම නිරාකරණය කිරීමේ දී ආර්ථික ප්‍රතිලාභ අඩංගු සම්පත් පිටතට ගලායාම.
C. ව්‍යාපාරයට වර්තමාන බැඳීමක් පැවතීම.
D. අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස අනාගත බැඳීමක් පැවතීම.
E. බැඳීම නිරාකරණය කිරීමේ දී ආර්ථික සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලා නොයාම.

(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D (5) D හා E (......)

(13) ව්‍යාපාරයක ලාභය ගණනය කිරීම සඳහා යොදාගත හැකි සමීකරණය වන්නේ,

(1) (ආරම්භක ශුද්ධ වත්කම් අවසාන ශුද්ධ වත්කම්) ගැනිලි අමතර ප්‍රාග්ධනය
(2) (ආරම්භක ශුද්ධ වත්කම් අවසාන ශුද්ධ වත්කම්) + ගැනිලි අමතර ප්‍රාග්ධනය
(3) (අවසාන ශුද්ධ වත්කම් ආරම්භක ශුද්ධ වත්කම්) + ගැනිලි අතිරේක ප්‍රාග්ධනය
(4) (අවසාන ශුද්ධ වත්කම් ආරම්භක ශුද්ධ වත්කම්) ගැනිලි + අතිරේක ප්‍රාග්ධනය
(5) (අවසාන ශුද්ධ වත්කම් + ආරම්භක ශුද්ධ වත්කම්) ගැනිලි අතිරේක ප්‍රාග්ධනය (......)

(14) මූලික සාක්ෂියක් ලෙසට නොසලකන කරුණක් වන්නේ,

(1) බැංකු ගිණුම් ප්‍රකාශයක් (2) චෙක්පතක්
(3) විකුණුම් ඉන්වොයිසියක් (4) හරපතක්
(5) ජ'නල් වවුචරයක් (......)

(15) ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය වැරදි සහගත වන්නේ ද?
(1) ගිණුම්කරණය තොරතුරු පද්ධතියක් ලෙසට ක්‍රියාකරයි.
(2) ගිණුම්කරණය සමාජ පැවැත්මට දායක වන විෂයකි.
(3) ගිණුම්කරණය ශුද්ධ විද්‍යාවක් ලෙසට සැලකේ.
(4) ගිණුම්කරණය ආරම්භක යුගවලදී සලකන ලද්දේ කලාවක් ලෙසයි.
(5) සමාගම් වල ගිණුම් තැබීම නීතිමය අවශ්‍යතාවයකි. (......)

- **ප්‍රශ්න අංක 16 හා 17 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

යොනාල් සනුජ ව්‍යාපාරයේ 2015/03/31 දිනට මුදල් පොතේ බැංකු තීරුවේ හර ශේෂය රු. 9,600 ක් විය. බැංකු ප්‍රකාශනයේ මෙදිනට තිබූ ශේෂය මුදල් පොතේ ශේෂය සමඟ සමාන නොවීය. මුදල් පොත හා බැංකු ප්‍රකාශනය සංසන්දනය කළ විට පහත වෙනස්කම් හඳුනාගත හැකිය.

1. බැංකුවේ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 7,000
2. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 4,000
3. මුදල් පොතේ සටහන් කර නැති බැංකු ගාස්තු රු. 100
4. මුදල් පොතේ සටහන් නොවූ ඍජුවම බැංකුවේ තැන්පත් කළ චෙක්පත රු. 2,000

(16) 2015/03/31 දිනට මුදල් පොතේ නිවැරදි ශේෂය වන්නේ,
(1) රු. 8,500 (2) රු. 10,700 (3) රු. 11,500 (4) රු. 7,700 (5) රු. 5,500 (......)

(17) 2015/03/31 දිනට බැංකු ප්‍රකාශනයේ පෙන්නුම් කළ ශේෂය වන්නේ,
(1) රු. 14,500 (2) රු. 10,700 (3) රු. 11,500 (4) රු. 8,500 (5) රු. 4,700 (......)

(18) පාලක ගිණුම්වලට අවශ්‍ය තොරතුරු ලබාගන්නේ,
(1) සාක්ෂි වලින් ය. (2) උපයෝගී පොත් වලින් ය.
(3) මූල්‍ය ප්‍රකාශන වලින් ය. (4) ශේෂ පිරික්සුම තුළින් ය.
(5) ලෙජර් ගිණුම් වලින් ය. (......)

(19) ණයගැති පාලක ගිණුමක සටහන් නොවන තොරතුරක් වන්නේ,
(1) ණයට විකුණුම් (2) දුන් වට්ටම්
(3) බොල් ණය කපාහැරීම් (4) අත්පිට විකුණුම්
(5) ණයගැති ලැබීම් (......)

(20) සල්මල් ව්‍යාපාරය 'සුළු මුදල් අගිම ක්‍රමය' ක්‍රියාත්මක කරයි. එමගින් එම ව්‍යාපාරයට ලබාගත හැකි වාසියක් නොවන්නේ,
(1) වියදම් වල පිරිමැසුම් දායක බවක් ඇති වේ.
(2) සුළු මුදල් ආශ්‍රිත වංචා හා වැරදි ඉක්මනින් අනාවරණය කරගත හැකිවේ.
(3) අවධානමක් ඇතිවූ විට නැති වී යන සුළු මුදල් ප්‍රමාණය උපරිමයකට සීමාකල හැකිවිය.
(4) බලාපොරොත්තු නොවන ඕනෑම සුළු මුදල් වියදමක් දැරීමේ හැකියාව ඇතිවේ.
(5) සුළු මුදල් ඒකකය තුළ අනවශ්‍ය මුදල් ඒකරාශී නොවීමෙන් මුදලේ උපරිම ඵලදායිතාව ලබාගත හැක.

(......)

(21) පහත සඳහන් කුමන සිදුවීමක් පොදු ජ'නලයේ වාර්ථා කරනු ලබයි ද?
(1) අත්පිට විකුණුම්
(2) නැවත විකිණීමේ අරමුනින් භාණ්ඩය ණයට ගැනීම
(3) සාමාන්‍යයෙන් වෙළඳාම් කරන භාණ්ඩ ණය විකුණුම්
(4) විකුණුම් ආපසු එවුම්
(5) ජංගම නොවන වත්කම් ණය ගැනීම (......)

The National e-learning Portal for The General Education

(22) ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම සඳහා රු. 25 000 ක් ගොඩනැගිලි ගිණුමට හර කිරීම,

(1) ලිපිකාර දෝෂයකි. (2) මූලධර්ම දෝෂයකි.
(3) ඌනතා දෝෂයකි. (4) අතිරික්තතා දෝෂයකි.
(5) ද්වීකරණ දෝෂයකි. (......)

(23) ණයගැති පාලක ගිණුමේ ශේෂය රු. 120,000 ක් වූ අතර, ණයගැති ශේෂ ලැයිස්තුවේ වටිනාකම රු. 130,000 කි. මෙවැනි වෙනසක් ඇතිවීමට හේතුවිය හැකි කරුණ වන්නේ,

(1) විකුණුම් ජ'නලයේ එකතුව රු. 10,000 ක් වැඩියෙන් ගෙන තිබීම.
(2) ණයගැතියන්ට දුන් වට්ටම් රු. 10,000 ක් ණයගැති ලෙජරයේ ණයගැති අමල්ගේ ගිණුමට හරකර තිබීම.
(3) පාලක ගිණුමට බොල්ණය රු. 10,000 ක් ගෙන නොතිබීම.
(4) ආපසු එවුම් රු. 5,000 ක් ණයගැති පියල්ගේ ගිණුමට හරකර තිබීම.
(5) ණයගැති පාලක ගිණුමට අගරු චෙක්පත් රු. 10,000 ත් බැර කර තිබීම. (......)

(24) ද්විත්ව සටහන් ක්‍රමය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වැරදි ප්‍රකාශය කුමක් ද?

(1) ගිණුම්කරණ සමීකරණය ද්විත්ව සටහන් ක්‍රමය සඳහා පදනම සපයයි.
(2) එය ගණුදෙනු ලෙජරයට පිටපත් කිරීමේ ක්‍රමය වේ.
(3) එහි මූලික රීතිය වන්නේ සෑම හර සටහනකට ම අනුරූපි බැර සටහනක් තිබිය යුතු බවයි.
(4) එය සියළුම ගණුදෙනු ලෙජරයේ නිවැරදි ව වාර්ථා වී ඇති බව තහවුරු කරයි.
(5) එය ලෙජරයට පිටපත් කරන ගනුදෙනුවල අංක ගණිතමය නිවැරදිතාවය සහතික කිරීමට උපකාරී වේ.

(......)

(25) තනි ව්‍යාපාරයක අයිතිකරුගේ හිමිකමට බලපෑමක් ඇති නොකරන්නේ පහත සඳහන් ගනුදෙනු අතුරෙන් කුමන ගනුදෙනුව ද?

(1) අයිතිකරු විසින් ආයෝජනය කිරීම.
(2) අයිතිකරු විසින් මුදල් ආපසු ගැනීම.
(3) විකුණුම් සඳහා මුදල් ලැබීම.
(4) නොඉපයූ ආදායම් සඳහා මුදල් ලැබීම.
(5) වියදම් සඳහා මුදල් ගෙවීම. (......)

(26) ආයතනයක එහි ගනුදෙනු හා සිද්ධීන් අනිකුත් පාර්ශවයන්ගෙන් ස්වාධීනව වාර්තා කිරීමට මඟ පාදන ගිණුම්කරණ සංකල්පය කුමක් ද?

(1) අඛණ්ඩ පැවැත්ම (2) ඒකක (3) ගැළපුම්
(4) ආරක්ෂණ (5) කාලච්ඡේද (......)

(27) පහත කාර්‍යයන් ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ සිදුවන නිවැරදි අනුපිළිවෙල කුමක් ද?

A - ගනුදෙනු සිදු වීම
B - ජර්නල් සටහන් ලෙජරයට පිටපත් කිරීම
C - ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීම
D - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම
E - ලෙජර් ගිණුම් තුලනය කිරීම

(1) ABCED (2) ACBED (3) CABED (4) CBADE (5) CBAED (......)

(28) ගිණුම් වර්ෂයක් අවසානයේ දී පිළිවෙලින් ශේෂ පියවනු ලබන්නේ හා ඉදිරියට ගෙනයනු ලබන්නේ පහත සඳහන් කුමන ගිණුම් වර්ග යුගලයේ ද?

	පියවන	ඉදිරියට ගෙන යන
(1)	වත්කම්	වියදම්
(2)	වියදම්	වත්කම්
(3)	වගකීම්	ආදායම්
(4)	ආදායම්	වියදම්
(5)	හිමිකම්	වියදම්

(......)

(29) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පොදු ලෙජරයේ ගිණුම්වල පිටපත් කර තිබූ ආකාරය පහත දැක්වේ.

ගණුදෙනු යොමුව	විස්තරය	'හර' කළ ගිණුම	'බැර' කළ ගිණුම
A	මෝටර් රථයක් අත්පිට මිල දී ගැනීම	මෝටර් රථ	මුදල්
B	ණයගැතියෙකුගෙන් චෙක්පතක් ලැබීම	මුදල්	ණයගැති පාලන
C	අමතර ප්‍රාග්ධනය යෙදීම	ප්‍රාග්ධනය	මුදල්
D	ණයහිමියෙකුට මුදල් ගෙවීම	ණයහිමි පාලන	මුදල්

ඉහත ගණුදෙනු අතුරෙන් ද්විත්ව සටහන් ක්‍රමයට අනුව, නිවැරදි ව ගිණුම්ගත කර ඇති ගණුදෙනු වන්නේ,

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය.

(4) A සහ D ය. (5) B සහ D ය. (......)

(30) සිල්වාගේ රෙදිපිළි ව්‍යාපාරය භාණ්ඩ මිල දී ගනු ලබන්නේ කාදර් සමාගමෙනි. 2015/09/30 දින එකක් රු. 900 බැගින් සාරි 20 ක් ද, එකක් රු. 500 බැගින් කලිසම් 50 ක් ණයට ගෙන තිබුණි. මෙම භාණ්ඩ සඳහා 10% ක වෙළඳ වට්ටමක් හිමි වූ අතර මාස දෙකක් ගතවීමට පෙර මුදල් ගෙවන්නේ නම් 5% ක මුදල් වට්ටමක් ද හිමි වේ. ඒ අනුව 2015/10/30 දින මෙම භාණ්ඩ සඳහා ගෙවිය යුතු සම්පූර්ණ මුදල සිල්වා විසින් ගෙවන ලදී.

ඉහත ගණුදෙනුවලට අදාළව මුළු ගැණුම් වටිනාකම හා කාදර් සමාගමට ගෙවන ලද සම්පූර්ණ මුදල පිළිවෙලින්,

(1) රු. 38,700 සහ රු. 36,765 කි. (2) රු. 43,000 සහ රු. 38,000 කි.

(3) රු. 38,700 සහ රු. 38,000 කි. (4) රු. 43,000 සහ රු. 43,000 කි.

(5) රු. 43,000 සහ රු. 36,765 කි. (......)

- **අංක 31 සිට 50 දක්වා කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

(31) අදාල තීරුවේ ලකුණක් යොදමින් පහත ප්‍රකාශය සත්‍ය හෝ අසත්‍ය බව දක්වන්න.

	සත්‍ය	අසත්‍ය
A. ගිණුම්කරණය සමාජ විද්‍යාවක් ලෙස නොසැලකේ.	....	....
B. ආයතනයක මුදලින් මැනිය හැකි ගෙනුදෙනු පමණක් ගිණුම් පොත්වල සටහන් කෙරේ.	....	....
C. වෙළඳ වට්ටම් ගිණුම්ගත නොකරයි.	....	....
D. ගිණුම්කරණ විෂයේ නිර්මාතෘ ඇඩම් ස්මිත් ය.	....	....

(32) මූලික පොත් රීතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

....

....

....

....

(33) ශේෂ පිරික්සුමක් සමවුවත් පැවතිය හැකි වැරදි හා ඌනතා 04 ක් දක්වන්න.

....

....

....

....

(34) පහත ගණුදෙනුවලට අදාළ සාක්ෂි නම් කරන්න.

(1) ණයට ගැණුම් ....

(2) සුළු මුදල් ගෙවීම් ....

(3) බොල් ණය කපාහැරීම් ....

(4) වියදම් සඳහා ගෙවීම් ....

(35) පහත ගණුදෙනුවලට අදාළ උපයෝගී පොත් නම් කරන්න.

(1) අත්පිට විකුණුම් ....

(2) ණයට විකුණුම් ....

(3) ආපසු එවුම් ....

(4) ආපසු යැවුම් ....

(36) හිමිකම් හා වගකීම් අතර ඇති වෙනස්කම් දෙකක් දක්වන්න.

හිමිකම්	වගකීම්
....	....
....	....
....	....
....	....

(37) උපයෝගී පොත් හා ලෙජර් ගිණුම් අතර ඇති වෙනස්කම් දෙකක් දක්වන්න.

උපයෝගී පොත්	ලෙජර් ගිණුම්
....	....
....	....
....	....
....	....
....	....

(38) ව්‍යාපාරයක පැවති සුළු මුදල් අග්‍රිමය රු. 15,000 කි. අග්‍රිමය ප්‍රමාණවත් නොවූ නිසා එය රු. 17,500 ක් දක්වා වැඩිකර ජනවාරි මාසය අගදී රු. 17,100 ලබා දී සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කරන ලදී.

(1) ජනවාරි මාසයේ ඒ දක්වා සුළු මුදලින් කර ඇති ගෙවීම් රු. ....

(2) අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම ගිණුම්ගත කිරීම සඳහා අදාළවන ජ'නල් සටහන දක්වන්න.

....

....

....

(39) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව අනුව වත්කමක ලක්‍ෂණ 03 ක් සඳහන් කරන්න.

....

....

....

....

....

(40) ගිණුම්කරණ විෂයේ මූලික බෙදීම් කීයද? ඒ මොනවා ද?

....

....

....

....

(41) පහත සඳහන් කරුණු කුමන පරිසර සාධකයට අයත් වන්නේ ද යන්න දක්වන්න.

(1) මෝටර් රථ ආනයන මත බදු අනුපාතයන් වෙනස් කිරීම [ ]

(2) දෙමාපියන්ට තම දියණියකගේ විවාහ උත්සව අවස්ථාවේදී දෑවැද්ද ලබාදීමට මුදල් ඉතිරිකරන බැංකු ගිණුම් ක්‍රමයක් බැංකුවෙන් හඳුන්වාදීම. [ ]

The National e-learning Portal for The General Education

(3) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව මත ප්‍රමිත හඳුන්වාදීම. } [ ]

(4) මූල්‍ය ප්‍රකාශන පොත් මුද්‍රණය කිරීම වෙනුවට සමාගමේ වෙබ් අඩවියක් හරහා මූල්‍ය ප්‍රකාශනය පරිශීලනය කිරීමට සැලැස්වීම. } [ ]

(42) ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් අතර ඇති වෙනස්කම් 02 ක් දක්වන්න.

ජංගම වත්කම්	ජංගම නොවන වත්කම්
(1)	(1) ....
....	....
(2)	(2) ....
....	....

(43) වියදම් හා වත්කම අතර ඇති වෙනස්වීම් දෙකක්,

වියදම්	වත්කම්
(1)	(1) ....
....	....
(2)	(2) ....
....	....

(44) ගිණුම්කරණ තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශවයන් 04 ක් දක්වන්න.

(1) ....

(2) ....

(3) ....

(4) ....

(45) යහපත් ගිණුම්කරණ තොරතුරු පද්ධතියක තිබිය යුතු ගුණාංග 04 ක් දක්වන්න.

(1) ....

(2) ....

(3) ....

(4) ....

e තක්සලාව The National e-learning Portal for The General Education

- **අංක 46 සිට 50 දක්වා හිස්තැන් පුරවන්න.**

46. ගනුදෙනු හා සිදුවීම් ගිණුම්කරණ .... ලෙස හැඳින්වේ.

47. ආංශික ලෙජර් ක්‍රමයේ දී පොදු ලෙජරයේ .... සටහන් සම්පූර්ණ වන අතර අතිරේක ලෙජර් වල .... සටහනක් පමණක් තබයි.

48. බැංකු අයිරාවක් පවතින විට ණය හිමියෙකුට චෙක්පතක් ලබා දුන් විට මුළු වගකීම ....

49. ගිණුම්කරණයේ අංක ගණිතමය නිරවද්‍යතාවය .... මඟින් පෙන්වයි.

50. විකුණුම් ආපසු එවුම් හා ගැණුම් වාර්තා කිරීමේ ප්‍රභව ලියවිලි වනුයේ පිළිවෙලින් .... හා .... වේ.

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ගිණුම්කරණය - II

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

උපදෙස් :-

- පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06 කට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීමේදී අළුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

(01) සල්මල් වෙළඳ ව්‍යාපාරයේ 2015/01 දිනට පහත මූල්‍යතත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය) උපුටා ගන්නා ලදී.

	රු.
ජංගම නොවන වත්කම්	
යන්ත්‍ර	400,000
ජංගම වත්කම්	
තොගය	300,000
ණයගැතියෝ	120,000
මුදල්	80,000
මුළු වත්කම	900,000
ප්‍රාග්ධනය	500,000
ජංගම වගකීම	
ණයහිමියෝ	400,000
මුළු හිමිකම් හා වගකීම්	900,000

2015 අගෝස්තු මාසයේ සිදු වූ ගණුදෙනු හා සිදුවීම් පහත දැක්වේ.

අගෝස්තු 04 අත්පිට මුදලට භාණ්ඩ ගැණුම් රු. 30,000.

අගෝස්තු 08 ණයට භාණ්ඩ ගත්තා රු. 80,000.

අගෝස්තු 12 රු. 50,000 පිරිවැය වූ භාණ්ඩ රු. 90,000 කට මුදලට වික්කා.

අගෝස්තු 20 රු. 30,000 පිරිවැය වූ භාණ්ඩ රු. 80,000 කට ණයට වික්කා.

අගෝස්තු 21 ගෙවල් කුලී ගෙව්වා රු. 10,000.

අගෝස්තු 23 විදුලිය වියදම් රු. 5,000 වුවත් මෙතෙක් ගෙවා නැත.

අගෝස්තු 25 යන්ත්‍ර රු. 10,000 ක් ක්ෂය කළා.

අගෝස්තු 28 ණයගැතියන්ගෙන් රු. 50,000 ක් ලැබුණා.

අගෝස්තු 30 අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 30,000 මුදල් ගෙන ගියා.

අගෝස්තු 31 ණය හිමියන්ට රු. 40,000 ක් මුදලින් ගෙව්වා.

e-තක්සලාව The National e-learning Portal for The General Education

අවශ්‍ය වන්නේ,

(1) ඉහත ගනුදෙනු වත්කම් = වගකීම් + හිමිකම් + (ආදායම් වියදම්) යන සමීකරණයේ වැඩිවීම (+) ලෙසත්, අඩුවීම () ලෙසත් වටිනාකම සහිතව ගලපන්න.

(2) ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න.

(3) ඉහත ගනුදෙනු මුදල් ඇතුළු ලෙජර් ගිණුම්වල වාර්ථා කරන්න.

(4) අගෝස්තු 31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

(ලකුණු 20)

(02) (අ) බණ්ඩාර දිසානායක මුද්‍රණ ආයතනයේ ගිණුම් ලිපිකරු විසින් 2015 නොවැම්බර් මාසයට අදාළ පහත සඳහන් මූලාශ්‍ර ලේඛණ ඔබට ඉදිරිපත් කර ඇත.

ඉන්වොයිසිය අංකය 501 — 2015/11/08

සරසවි පොත් වෙළෙන්දෝ

අංක 12, නුවර පාර, නුවර.

කළමනාකරු

බණ්ඩාර දිසානායක මුද්‍රණාලය

බණ්ඩාරවෙල

අනු අංකය	විස්තරය	ප්‍රමාණය	ඒකක මිල	වටිනාකම
1	මුද්‍රණ කඩදාසි	රෝල් 20	2,500	50,000.00
2	මුද්‍රණ තීන්ත	බෝතල් 15	3,500	52,500.00
				102,500.00
	අඩුකල වට්ටම් 10%			(10,250.00)
				92,250.00

ඉන්වොයිසිය අංකය 0014 — 2015/11/20

රෝයල් පොත් වෙළෙන්දෝ

අංක 15, රණවිරු මාවත, බණ්ඩාරවෙල.

කළමනාකරු

බණ්ඩාර දිසානායක මුද්‍රණාලය

බණ්ඩාරවෙල

අනු අංකය	විස්තරය	ප්‍රමාණය	ඒකක මිල	වටිනාකම
1	ස්ටේප්ලර් කටු	පෙට්ටි 20	500	10,000.00
2	ආට් බෝඩ්	රෝල් 50	1,500	75,000.00
				85,000.00
	අඩුකල වට්ටම් 10%			(8,500.00)
				76,500.00

හරපත අංකය 314 2015/11/10

කළමනාකරු,

බණ්ඩාර දිසානායක මුද්‍රණාලය,

බණ්ඩාරවෙල

සරසවි පොත් වෙළෙන්දෝ

අංක 12, නුවර පාර,

නුවර.

2015/11/08 ඉන්වොයිස් අංක 501 යටතේ ගත්භාණ්ඩ ආපසු යැවීම

අනු අංකය	විස්තරය	ප්‍රමාණය	ඒකක මිල	වටිනාකම
008	මුද්‍රණ කඩදාසි	රෝල් 03	2,500	7,500.00
009	මුද්‍රණ තීන්ත	බෝතල් 02	3,500	7,000.00
				14,500.00
	අඩුකල වට්ටම් 10%			(1,450.00)
				13,050.00

හරපත අංකය 0014 2015/11/25

කළමනාකරු,

බණ්ඩාර දිසානායක මුද්‍රණාලය,

බණ්ඩාරවෙල

රොයල් පොත් වෙළෙන්දෝ

අංක 15, රණවිරු මාවත,

බණ්ඩාරවෙල.

ඉන්වොයිස් අංක 0014 යටතේ 2015/11/20 ගත් භාණ්ඩ ආපසු යැවීම

අනු අංකය	විස්තරය	ප්‍රමාණය	ඒකක මිල	වටිනාකම
008	ස්ටේප්ලර් කටු	පෙට්ටි 02	500	1,000.00
009	ආට් බෝඩ්	රෝල් 05	1,500	7,500.00
				8,500.00
	අඩුකල වට්ටම් 10%			(850.00)
				7,650.00

අවශ්‍ය වන්නේ,

(1) බණ්ඩාර දිසානායක මුද්‍රණාලයේ ඉහත සඳහන් මූලාශ්‍ර ලේඛනවල තොරතුරු සටහන් කළ යුතු මූලික පොත් නම් කරන්න.

(2) ඉහත මූලාශ්‍ර ලේඛනවල සඳහන් ගණුදෙනු මූලික පොත්වල සටහන් කරන්න.

(3) ඔබ මූලික පොත්වල සටහන් කළ ගනුදෙනු ලෙජර් ගිණුම්වල ලියා දක්වන්න.

(ලකුණු 10)

(ආ) 2015 මාර්තු මාසය තුළ දී සිදු වූ ගනුදෙනුවල විස්තර පහත දී ඇත.

ණය ගැතියෝ	ආරම්භක ශේෂය	විකුණුම්	ලද මුදල්	දුන් වට්ටම්	ආපසු එවුම්
	රු.	රු.	රු.	රු.	රු.
මලින්ද	40,000	70,000	100,000		
මිලින්ද	30,000	80,000	60,000	2,000	3,000
ලහිරු	20,000	20,000	30,000	2,000	5,000
ගාමිණී	(5,000)	15,000	10,000		
රුවන්		15,000	15,000		5,000
	85,000	200,000	215,000	4,000	13,000

අතිරේක තොරතුරු,

1. මිලින්දට විකුණුම් කළ රු. 20,000 ක් වැරදීමකින් ඉහත පෙන්වන මලින්දගේ විකුණුම් වටිනාකමේ ඇතුලත් කර ඇත.
2. 2015 මාර්තු 31 දින ලහිරුගේ ශේෂය අයකර ගත නොහැකි වූ අතර එය බොල් ණය ලෙස කපා හරින ලදී.

අවශ්‍ය වන්නේ,

(1) ණයගැති පාලක ගිණුම.

(2) ණයගැති ලෙජරය හා ණයගැති ශේෂ ලැයිස්තුව.

(ලකුණු 10)

(03) අමිල ව්‍යාපාරයේ ඔක්තෝම්බර් මාසයේ පහත ගණුදෙනු සිදුවී තිබේ. ඔක්තෝම්බර් 01 දිනට මුදල් පොතේ රු. 125,000 ක ශේෂයක් දක්නට ලැබුණි.

ඔක්තෝබර් 01 අත්පිට විකුණුම් රු. 130,000.

ඔක්තෝබර් 03 10% වට්ටමකට යටත්ව රංගගෙන් ලද මුදල රු. 45,000.

ඔක්තෝබර් 04 අත්පිට විකුණුම් රු. 55,000.

ඔක්තෝබර් 05 ගෙවල්කුලී මුදලින් ගෙව්වා රු. 11,000.

ඔක්තෝබර් 08 බැංකුවේ පොළී ආදායම් ලැබුණා රු. 24,000.

ඔක්තෝබර් 13 විදුලිය වියදම් ගෙව්වා රු. 13,000.

ඔක්තෝබර් 15 10% වට්ටමකට යටත්ව ණයහිමි උපාලි සමාගමට මුදල් ගෙව්වා රු. 27,000.

ඔක්තෝබර් 17 රු. 20,000 ණය පියවීමට ප්‍රමාණවත් මුදලක් 10% වට්ටමකට යටත්ව තුෂාරගෙන් ලැබුනා.

ඔක්තෝබර් 20 රු. 30,000 ණය පියවීමට ප්‍රමාණවත් මුදලක් 20% වට්ටම් යටතේ අමිලට ගෙව්වා.

ඔක්තෝබර් 24 රු. 38,000 කට පරිඝණකයක් මිලදී ගත්තා.

ඔක්තෝබර් 26 ණයහිමි ලයනල් සමාගමට ගෙව්වා රු. 16,000.

ඔක්තෝබර් 28 ණයගැති කෝසලගෙන් ලැබුණා රු. 13,000.

ඔක්තෝබර් 30 වරිපනම් මුදලින් ගෙව්වා රු. 4,000.

අවශ්‍ය වන්නේ,

(1) විකුණුම්, ණයගැති ලැබීම්, විවිධ විශ්ලේෂණ තීරු ඇතුළත් වට්ටම් තීරු සහිත ලැබීම් ජ'නලයක්.

(2) වියදම්, වත්කම්, විවිධ විශ්ලේෂණ තීරු ඇතුළත් වට්ටම් තීරු සහිත ගෙවීම් ජ'නලයක්.

(3) මුදල් ගිණුම් සහ වට්ටම් ගිණුම්.

(ලකුණු 15)

(04) (අ) රොමේෂ් සිල්වා සමාගම 2015 අගෝස්තු මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශනය හා 2015 සැප්තැම්බර් මාසයේ මුදල් පොත හා බැංකු ගිණුම් ප්‍රකාශනය පහත දැක්වේ.

2015 අගෝස්තු බැංකු සැසඳුම්

	රු.	රු.
මුදල් පොතට අනුව බැංකු ශේෂය		90,000
එකතු කළා		
නිකුත් කළා නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්		
නාමල් (R 120)	20,000	
කමල් (R 182)	30,000	50,000
අඩු කළා		140,000
උපලබ්ධි නොවූ තැන්පතු		
චෙක්පත්	11,000	
චෙක්පත්	21,000	(32,000)
බැංකු ප්‍රකාශනයට අනුව බැංකු ශේෂය		108,000

මුදල් පොත (බැංකු) 2015 සැප්තැම්බර්

ශේෂය ඉ/ගෙ	90,000	නිකුත් කළ චෙක්පත්	
මුදල් තැන්පතු	40,00	යමපාල (R 201)	30,000
චෙක් තැන්පතු	15,000	සුමනපාල (R 202)	20,000
චෙක් තැන්පතු	10,000	සොම්පාල (R 203)	15,000
චෙක් තැන්පතු	25,000	මරිසිපාල (R 204)	13,000
චෙක් තැන්පතු	12,000	ගුණපාල (R 205)	10,000
		ශේෂය ප/ගෙ	94,000
	182,000		182,000
ශේෂය ඉ/ගෙ	94,000		

The National e-learning Portal for The General Education

බැංකු ගිණුම් ප්‍රකාශය 2015 සැප්තැම්බර්

විස්තරය	හර	බැර	ශේෂය
ශේෂය ඉ/ගෙ			108,000
චෙක්පත් (R 120)	20,000		88,000
මුදල් තැන්පතු		40,000	128,000
චෙක් තැන්පතු		11,000	139,000
චෙක්පත් (R 201)	30,000		109,000
රක්‍ෂණ ගෙවීම්	9,000		100,000
චෙක් තැන්පතු		25,000	125,000
චෙක්පත් (R 203)	15,000		110,000
ලාභාංශ ලැබීම්		20,000	130,000
චෙක්පත් (R 205)	10,000		120,000
බැංකු ගාස්තු	2,000		118,000
ප්‍රේශණ මුදල්		30,000	148,000
ගෙවල් කුලී	10,000		138,000
හරබදු	1,000		137,000

අවශ්‍ය වන්නේ,

සංශෝධිත මුදල් පොතේ ක්‍රමයට බැංකු සැසඳුම් පිළියෙල කරන්න.

(ලකුණු 10)

(ආ) සිරිමලී ව්‍යාපාරයේ 2015/03/31 දිනට සකස් කරන ලද ශේෂ පිරික්සුම සම නොවීය. බැර තීරුවට වඩා හර තීරුව රු. 6,160 කින් වැඩි විය. ඒ වෙනස අවිනිශ්චිත ගිණුමේ සටහන් කරන ලදී. පහත සඳහන් වැරදි පසුව සොයා ගන්නා ලදී.

1. ආපසු එවුම් ජ'නලය එකතු කිරීමේ දී රු. 500 ක් වැඩි වී ඇත.
2. රු. 2,000 ක බැංකු අයිරාව ශේෂ පිරික්සුමේ ඇතුළත් කර ඇත්තේ වැරදි පැත්තේ ය.
3. ලද ගෙවල් කුලී රු. 1,500 මුදල් පොතේ නිවැරදිව දක්වුණු අතර ලැබූ ගෙවල් කුලී ගිණුමේ වැරදි පැත්තේ සටහන් කර තිබීම.
4. ණය ගැතියෙකු වූ දිනේෂ්ගෙන් ලද රු. 4,050 මුදල් පොතේ නිවැරදිව සටහන් වී තිබුණ ද දිනේෂ්ගේ ගිණුමට පිටපත්කර තිබුණේ රු. 5,040 ක් ලෙස ය.
5. විදුලි වියදම් ගිණුමේ ශේෂය රු. 350 ශේෂ පිරික්සුමට ඇතුළත් කර නැත.

අවශ්‍ය වන්නේ,

(1) වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන (සංලක්‍ෂය අවශ්‍ය නොවේ)

(2) අවිනිශ්චිත ගිණුම (ල.05)

(මුළු ලකුණු 15)

(05) (අ) ඩිල්මන් ව්‍යාපාරයේ 2015/08/31 දිනට උපුටාගත් වත්කම් හා වගකීම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	රු.		රු.
මෝටර් රථ (පිරිවැයට)	400,000	බැංකු ණය	70,000
මෝටර් රථ ක්ෂය වෙන්කිරීම්	80,000	ඉදිරියට කළ වියදම්	5,000
යන්ත්‍ර (පිරිවැයට)	300,000	උපචිත වියදම්	8,000
යන්ත්‍ර ක්ෂය වෙන්කිරීම	120,000	ලැබිය යුතු බිල්	50,000
ලැබිය යුතු ගිණුම්	100,000	ගෙවිය යුතු බිල්	40,000
අඩමාණ ණය වෙන්කිරීම්	10,000	බැංකු අයිරාව	15,000
මුදල් ශේෂය	30,000	ආයෝජන	110,000
තොගය (පිරිවැයට)	60,000	කීර්තිනාමය	60,000

2015/08/31 දිනට මූල්‍යතත්ව ප්‍රකාශය පිළියෙල කොට ප්‍රාග්ධනය සොයන්න. (ලකුණු 07)

(ආ) ශමිඳු වෙළඳ ව්‍යාපාරයේ 2015 වර්ෂයේ පහත තොරතුරු අනාවරණය කෙරේ.

	රු.		රු.
ණයගැති (හර) ශේෂය	130,000	ණයහිමි (බැර) ශේෂ	110,000
ණයගැති (බැර) ශේෂය	20,000	ණයහිමි (හර) ශේෂ	15,000

The National e-learning Portal for The General Education

පහත තොරතුරු දී ඇත.

	රු.		රු.
ණයට විකුණුම්	630,000	ආපසු එවුම්	21,000
ණයට ගැණුම්	450,000	ආපසු යැවුම්	15,000
ණයගැතියන්ගෙන් ලද මුදල්	500,000	ණයගැතියන්ගෙන් අයකළ පොලී	10,000
ණයහිමියන්ට ගෙවූ මුදල්	320,000	අගරු වූ ලැබිය යුතු බිල්	12,000
ණයගැතියන්ගෙන් ලද චෙක්පත්	10,000	අගරු වූ ගෙවිය යුතු බිල්	8,000
ණයහිමියන්ට චෙක්පත් වලින් ගෙවීම	60,000		
දුන් වට්ටම්	30,000		
ලද වට්ටම්	20,000		
කපාහල බොල්ණය	15,000		
2015/12/31 දිනට ශේෂය			
ණයගැති (බැර) ශේෂය	10,000		
ණයහිමි (හර) ශේෂය	5,000		

අවශ්‍ය වන්නේ,

(1) ණයගැති පාලක ගිණුම හා ණයහිමි පාලක ගිණුම පෙන්වන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 15)

(06) අජිත්ගේ ලෙජරයේ පහත සඳහන් ගිණුම් දිස්වේ.

සුජිත්

1/1 ශේෂය ඉ/ගෙ	8,855	1/5 මුදල්	1,150
1/10 විකුණුම්	2,208	1/13 ආපසු එවුම්	184
1/30 පොළී	46	1/31 ශේෂය ප/ගෙ	9,775
	11,109		11,109
2/1 ශේෂය ඉ/ගෙ	9,775		

රජිත්

1/4 මුදල්	12,466	1/1 ශේෂය ඉ/ගෙ	12,880
1/4 ලද වට්ටම්	414	1/12 ගැණුම්	2,714
1/16 ආපසු යැවුම්	299		
1/31 ශේෂය ප/ගෙ	2,415		
	15,594		15,594
		2/1 ශේෂය ඉ/ගෙ	2,415

ඉහත ගිණුම්වල සටහන් කොට ඇති එකිනෙක ගණුදෙනුව සඳහා,

(1) ගණුදෙනුව වටිනාකමක් සමග සඳහන් කරන්න.

(2) එම ගණුදෙනු සටහන් කරන මූලික පොත් නම් කරන්න.

(3) ගණුදෙනුවට අදාල මූලික සාක්ෂිය නම් කරන්න. (සටහන : අජිත්ගේ ව්‍යාපාරයට අදාළ තත්ත්වය)

(ලකුණු 15)

(07) (1) ගිණුම්කරණ යෙදවුම් වශයෙන් අදහස් කරන්නේ කුමක් ද?

(2) 2015/07/31 දිනට නිෂ්පාදන ආයතනයක් පිළිබඳ පහත සඳහන් තොරතුරු ලබාගත හැකිවේ.

1. ව්‍යාපාරයේ මුළු වත්කම් රු. 150,000.
2. ව්‍යාපාරය පිහිටා ඇත්තේ ප්‍රධාන ගුවන් තොටුපලට සැතපුම් 10 ක් ඊසාන දෙසිනි.
3. ව්‍යාපාරයේ වගකීම් රු. 50,000 කි.
4. මුළු වත්කම් වලින් රු. 60,000 ජංගම වත්කම් වේ.
5. ව්‍යාපාරයේ කළමනාකරුගේ වයස අවුරුදු 62 කි.
6. ව්‍යාපාරය සතු භාණ්ඩ තොගයේ වටිනාකම රු. 10,000 කි.
7. කාර්යාල ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් වායු සමීකරණය කර ඇත.
8. ව්‍යාපාරයේ වැඩකරන මුළු සේවක සංඛ්‍යාව 30 කි.
9. වගකීම් වලින් රු. 20,000 ක් ස්ථාවර වත්කම් ඇපයට තබා බැංකුවෙන් ලබාගත් දිගුකාලීන ණය මුදලක්.
10. මේ ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලිය නිසා සිදුවන පරිසර දූෂණය පිළිබඳ පැමිණිලි ලැබී ඇත.

අවශ්‍ය වන්නේ,

(1) ගිණුම් කරණ විඥාපන (තොරතුරු) යන්න නිර්වචනය කරන්න.

(2) ගිණුම්කරණ විඥාපන (තොරතුරු) පිළිබඳ ඔබගේ නිර්වචනය අනුව ඊට ඇතුළත් අයිතම හා ඇතුළත් නොවන අයිතම වල අංක සඳහන් කරන්න.

(3) මූලික පොත් රීතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(4) බැංකු සැසඳුම් ප්‍රකාශයන් යනු කුමක් ද?